*ඇමුණුම 01*

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරට පත්කිරීමට අදාළ ලකුණු ලබාදීමේ පරිපාටිය

<table>
<tr><th>නිර්ණායක</th><th>ලකුණු ලබාදෙන ආකාරය</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>01. ජ්‍යෙෂ්ඨතාවය</td><td>මෙහිදී උපරිම ලකුණු ලබාදෙනු ලබන්නේ ඉහළම ජ්‍යෙෂ්ඨත්වයක් සහිත අයදුම්කරුට වන අතර, අනෙකුත් අයදුම්කරුවන් සඳහා ජ්‍යෙෂ්ඨත්වය සඳහා සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>50</td></tr>
<tr><td>02. ක්ෂේත්‍රයේ / ක්ෂේත්‍රවල පළපුරුද්ද</td><td>

**2.1. ආයුර්වේද වෛද්‍ය පරිපාලනය.**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද පළාත් ආයුර්වේද රෝහලක රෝහල් අධ්‍යක්ෂ වශයෙන් හෝ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය / සහකාර ආයුර්වේද කොමසාරිස් වශයෙන් රාජකාරි කිරීම වෙනුවෙන් එම සේවා කාලයට අදාළව පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

(ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට අයත් තනතුරකට විධිමත් පරිදි පත්වීමක් හෝ වැඩ බැලීමේ පත්වීමක් ලබා සේවය කර ඇති සේවා කාලය ද සලකා බලනු ලැබේ.)

<table>
<tr><th>සේවා කාලය</th><th>ලකුණු</th></tr>
<tr><td>අවුරුදු $3 \leq 5$</td><td>02</td></tr>
<tr><td>අවුරුදු $5 < 6$</td><td>04</td></tr>
<tr><td>අවුරුදු $6 \leq$</td><td>05</td></tr>
</table>

(උපරිම ලකුණු 05)

**2.2. රෝහල් කළමනාකරණය.**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද පර්යේෂණ / ශික්ෂණ ආයුර්වේද රෝහලක, දිස්ත්‍රික් ආයුර්වේද / ග්‍රාමීය ආයුර්වේද රෝහලක, කාර්යභාර වෛද්‍ය නිලධාරී / වෛද්‍ය අධිකාරී වශයෙන් හෝ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය / සහකාර ආයුර්වේද කොමසාරිස් වශයෙන් රාජකාරි කිරීම වෙනුවෙන් එම සේවා කාලයට අදාළව පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

(ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට අයත් තනතුරකට විධිමත් පරිදි පත්වීමක් හෝ වැඩ බැලීමේ පත්වීමක් ලබා සේවය කර ඇති සේවා කාලය ද සලකා බලනු ලැබේ.)

<table>
<tr><th>සේවා කාලය</th><th>ලකුණු</th></tr>
<tr><td>අවුරුදු $3 \leq 5$</td><td>02</td></tr>
<tr><td>අවුරුදු $5 < 6$</td><td>04</td></tr>
<tr><td>අවුරුදු $6 \leq$</td><td>05</td></tr>
</table>

(උපරිම ලකුණු 05)

</td><td>10</td></tr>
</table>

**03. වෘත්තීය සුදුසුකම් / පර්යේෂණ සහ නවෝත්පාදන.**

**3.1. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම.**

ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ II පරිශිෂ්ඨයේ ඇතුළත් විෂයයන් සම්බන්ධව,

- අ. පර්යේෂණයක් මත පදනම් වන පශ්චාත් උපාධිය - ලකුණු 07
- ආ. පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) - ලකුණු 06
- ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 04
- ඈ. උපාධි / පශ්චාත් උපාධි සහතිකය - ලකුණු 02

සටහන : බඳවා ගැනීමේ දී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ ශ්‍රේණි උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාළ කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

මූලික සුදුසුකමේදී සළකා බලන ලද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට ඉහළ සුදුසුකමක් සපුරා ඇත්නම් ඊට අදාළව ලකුණු ලබා දෙනු ලැබේ.

**3.2. පර්යේෂණ හා නවෝත්පාදන.**

- අ. ආයුර්වේද ක්ෂේත්‍රයේ පේටන්ට් බලපත්‍ර / ප්‍රකාශන හිමිකම් සහිත නවෝත්පාදන / නිපැයුම් - ලකුණු 10
- ආ. ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක ප්‍රකාශයට පත් කරන ලද ආයුර්වේද ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකාව - ලකුණු 05
- ඇ. පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක පළ වූ ආයුර්වේද ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකාව - ලකුණු 04
- ඈ. ආයුර්වේද ක්ෂේත්‍රයෙහි සාර්ථක වූ නවෝත්පාදන ක්‍රියාත්මක කිරීම / තොරතුරු තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම - ලකුණු 04 බැගින්

(වාර්තාමය සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය)

**3.3. ක්ෂේත්‍රයට අදාළ පුහුණු.**

(ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව හෝ කළමනාකරණය පිළිබඳ ලබා ඇති පුහුණු සඳහා)

- අ. මාස 03 හෝ ඊට වැඩි කාලයක් - ලකුණු 01
- ආ. දින 10 ක් හෝ ඊට වැඩි කාලයක් - ලකුණු 0.5
- ඇ. දින 03 හෝ ඊට වැඩි කාලයක් - ලකුණු 0.2

**3.4. අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය.**

- අ. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ජාතික භාෂා සුදුසුකම් පරීක්ෂණයේදී ලකුණු 80 සිට 100 දක්වා (NLQ පරීක්ෂණය) - ලකුණු 04
- ආ. NLQ පරීක්ෂණයේ දී ලකුණු 65 සිට 79 දක්වා / පිළිගත් විශ්වවිද්‍යාලයකින් / රාජ්‍ය භාෂාව දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ඕනෑම රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව. - ලකුණු 03
- ඇ. NLQ පරීක්ෂණයේ දී ලකුණු 50 සිට 64 දක්වා / පිළිගත් විශ්වවිද්‍යාලයකින් / රාජ්‍ය භාෂාව දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ඕනෑම රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් භාෂාව පිළිබඳ සහතික පත්‍රය හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අනෙක් රාජ්‍ය භාෂාව සමත් වීම. - ලකුණු 02

සටහන : 2020.10.16 දිනැති රා.ප.ච.ලේ. අංක 18/2020 හි 5.1.2 වගන්තියට අනුව වලංගු භාවය පවත්වාගෙන ඇත්නම් පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

15

| | | |
|---|---|---|
| | **3.5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය.**<br>අ. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රාජ්‍ය පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක්.<br>IELTS විභාගයේ සමස්ථ ලකුණු අගය 6.5 හෝ ඊට ඉහල, TOFEL-IBT 79 හෝ ඊට වැඩි, TOFEL-CBT 213 හෝ ඊට වැඩි TOFEL-PBT 500 හෝ ඊට වැඩි - ලකුණු 03<br>*සටහන: අයදුම් පත්‍රය කැඳවනු ලබන අවසාන දිනට ආසන්න වසර 02 ක් තුළ* ප්‍රවීණතාවය ලබා තිබිය යුතු ය.<br>ආ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍රය. - ලකුණු 01<br>★ **ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | |
| **04. ශක්තීන්.** | වර්තමාන ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ පවත්නා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට ඔබ විසින් කරනු ලබන නව යෝජනා ඇසුරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය යොමු කරනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීම.<br>i. නිර්මාණශීලිත්වය<br>ii. පරිපාලනමය නිපුණතා<br>iii. සන්නිවේදන කුසලතාවය | 10 |
| **05. චර්යාත්මක නිපුණතා** | අහඹු ලෙස සිද්ධියක් තෝරාගෙන අධ්‍යනය කිරීමට අවස්ථාව ලබා දී අයදුම්කරු විසින් එය හසුරුවන ආකාරය අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අසන ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු ඇසුරින් ලකුණු ලබා දීම.<br>i. කළමනාකරණ කුසලතා<br>ii. තීරණ ගැනීමේ හැකියාව<br>iii. අන්තර් පුද්ගල සම්බන්ධතාවය / සහයෝගීතා කුසලතා | 10 |
| **06. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** | සම්මුඛ පරීක්ෂණය සඳහා පූර්ව සූදානම / කරුණු ඉදිරිපත් කිරීම / නගනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම / සාමාන්‍ය හැසිරීම / සාමාන්‍ය අවබෝධය යන කරුණු සලකා බලනු ලැබේ. | 05 |
| **එකතුව** | | 100 |